# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1887/16 - 2014 නොවැම්බර් මස 04 වැනි අඟහරුවාදා - 2014.11.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 289 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 හා 2014 ජනවාරි මස 21 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මහ නගර සභා නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන් සඳහා ගමන් වියදම් දීමනා ගෙවීමට අදාළ නියෝග, බස්නාහිර පළාත් සභාව විසින් 2014.10.07 වන දින රැස්වීමේදී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තියේම වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 03 වන දින.
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

11 - 520/1

1A - PG 2238 — 60 (2014/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 255 වන මහ නගර සභා ආඥා පනතේ 193(1)(උඋ) වැනි උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 හා 2014 ජනවාරි මස 21 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකවරුන් සඳහා වන ගමන් වියදම් දීමනා ගෙවීමට අදාළ රීති, බස්නාහිර පළාත් සභාව විසින් 2014.10.07 වන දින රැස්වීමේදී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 194 වැනි වගන්තියේ විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 03 වන දින.
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

11 - 520/2

---

## බස්නාහිර පළාතේ පළාත් සභාව

### නිවේදනය

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සාදා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/19 හා 2014 ජනවාරි මස 21 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකවරුන් සඳහා වන ගමන් වියදම් දීමනා ගෙවීමට අදාළ රීති, බස්නාහිර පළාත් සභාව විසින් 2014.10.07 වන දින රැස්වීමේදී අනුමත කරන්නට යෙදුන බව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184(2) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා,
ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති පිළිබඳ අමාත්‍ය.

2014 නොවැම්බර් මස 03 වන දින.
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

11 - 520/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.